# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2037/2 - 2017 සැප්තැම්බර් මස 18 වැනි සඳුදා - 2017.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 39අ(1) වැනි වගන්තිය යටතේ නියමය**

1991 ජනවාරි මස 21 වැනි දින අංක 698/2 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 1992 අංක 12 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වන උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මඟින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

*මගේ අංකය* : 03J/91/LRB/219.
*ඉඩම් අත්කර ගැනීමේ නිලධාරීගේ අංකය* : GCF/ATH/NG/24/LR.
2017.09.15
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර" ඉඩම් මහ ලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 520 බී - නාවල නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නාවල (කොට්ඨාස අංක 4, නාවල, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා) ගමේ පිහිටි

සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක 9696 දරන සංශෝධිත මූලික පිඹුරේ පෙන්නුම් කර ඇති පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්,

**01. කැබලි අංක 02 - ඉඩමේ නම : තුම්මෝදර කුඹුර සහ ඕවිට ප්‍රමාණය : හෙක්ටයාර් 0.2521**

| | |
|---|---|
| *උතුරට* | : මු.පි.කො 7361හි කැබලි අංක 4 සහ මෙම පිඹුරේ කැබලි අංක 3, |
| *නැගෙනහිරට* | : මෙම පිඹුරේ කැබලි අංක 3 සහ පන්සල පාරෙහි, වරිපනම් අංක 120හි, ඩී. සී. පී. රාජපක්ෂ හිමිකම් කියන ඉඩම, |
| *දකුණට* | : මෙම පිඹුරේ කැබලි අංක 4 සහ 1, |
| *බටහිරට* | : මෙම පිඹුරේ කැබලි අංක 1 සහ මු.පි.කො. 7361හි කැබලි අංක 4. |

10 - 01

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.